| Set A 1 | සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව<br>சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்<br>Sabaragamuwa Provincial Department of Education |
|---|---|

| | |
|---|---|
| **පළමු වාර පරීක්ෂණය 2018**<br>**இரண்டாம் தவணைப் பரீட்சை 2018**<br>**First Term Test 2017** | **08 ශ්‍රේණිය**<br>**தரம் 08**<br>**Grade 08** |

| | |
|---|---|
| **සිංහල භාෂාව හා සාහිත්‍යය 1**<br>**Sinhala Language And Literature 1** | **පැය දෙකයි**<br>*Two Hour* |

## I කොටස

* හිස් තැනට සුදුසු පිළිතුර තෝරන්න.

01. ඇවිලෙන ගින්නට ........................................... දැම්මා වගෙයි.

i. බොරළු ii. වතුර iii. දර iv. පිදුරු

02. කටුස්සගේ කරේ........................................ බැන්දා වාගේ,

i.මුතු ii. රත්තරන් iii.ගෙජ්ජි iv.මාලයක්

03. අප <u>අහළ පහළ</u> අය සමග සමගියෙන් සිටිය යුතුය.

මෙහි ඉරි ඇඳි පදය

i. සමාන පදයකි. ii. විරුද්ධ පදයකි. iii. යුගල පදයකි. iv. නාම පදයකි.

04. මහප්‍රාණ අකුරක් යෙදී නැති පදය තෝරා යටින් ඉරක් අඳින්න.

i. ශීඝ්‍රගාමී ii. ගෞරවය iii. අභිනන්දන iv. ප්‍රාර්ථනා

05. *අක්ෂර වින්‍යාසය නිවැරදිව ලියා ඇති වචනය වන්නේ,

i. නිශ්ඵල ii. කලමණාකරණය iii. පරිඝණකය iv. ප්‍රථිඵලය

*අකාරාදිය පිළිවෙළට පද යෙදී ඇති පිළිතුර තෝරන්න.

i. අමනාවල, ඊරියගොල්ල, උඩුගොඩ, කැගල්ල

ii. අවිස්සාවේල්ල, යටියන්තොට, රත්නපුර, නිවිතිගල

iii. කතරගම, ගාල්ල, තංගල්ල, ඇඹිලිපිටිය

iv. මඩකලපුව, වව්නියාව, හසලක, බණ්ඩාරවෙල

07.''හිමියණි, ඔහුට සමාව <u>දෙනු මැනවි</u>'' මෙහි ඉරි ඇඳි පදය,

i. විධි ක්‍රියාවකි. ii. ආශීර්වාද ක්‍රියාවකි.

iii. මිශ්‍ර ක්‍රියාවකි.. iv. පූර්ව ක්‍රියාවකි.

08. පමාවෙලා වැහැපන් වැහි වලාවේ,

i. පූර්ව ක්‍රියාවකි. ii. මිශ්‍ර ක්‍රියාවකි.

iii. විධි ක්‍රියාවකි. iv. ආශීර්වාද ක්‍රියාවකි.

09. .''*සඳ යන පදයටසමාන පදය යටින් ඉරක් අඳින්න.''

i. දියනෙත ii. සුරමග iii. නිසයුරු iv. සහස්කර

10. ''නින්දාව'' යන පදයට විරුද්ධාර්ථය දෙන පදය තෝරන්න.

i. අගෞරව ii. නම්බුව iii. ප්‍රශංසාව iv. නිර්භීත

11. ඔහු ගෙට ගොඩ වූවිගස මල්ලිත් නංගිත් දුවගෙන .........................................

i. ආවේ ය. ii. ආහ. iii. ආවාය. iv. ආවෙමු.

12. හිත ඇත්නම් පත කුඩාද යනු.

i. ප්‍රස්ථාව පිරිළකි. ii. ඉඟි වැකියකි.

iii. රූඩියකි. iv. ආප්තෝපදේශයකි.

13. සමන් පිච්ච මල් ඉහිරුණු නිල් තණකොළ පිට්ටනියක් වගෙයි ''<u>අහස</u> අන්න බලනු''
මෙහි ඉරි ඇඳි පදය,

i. රූපකයකි. ii. උපමෙයකි. iii. ඉඟි වැකියකි. iv. උපමාවකි.

14. එස්.මහින්ද හිමියන් රචනා කරන ලද පද්‍ය කෘතියක් නොවන්නේ,

i. රාත්‍රිය ii. කව්මිණි

iii. ලංකා මාතා iv. කවි සිළුමිණ

15. ''පෙත්සම'' නව කතාව රචනා කරන ලද්දේ,

i. මාර්ටින් වික්‍රමසිංහ ii. ඇස්.මහින්ද හිමි

iii. ලීල් ගුණසේකර මහතා iv. මහගම සේකර මහතා

16. දැන්වීම් පත්‍රයක අනිවාර්ය ලක්ෂණයක් නොවන්නේ,

i. සංක්ෂිප්ත බව ii. ආමන්ත්‍රණය

iii. සරල බව iv. ආකර්ෂණීය බව

17. ජීව දත්ත පත්‍රිකාවක වැදගත්ම අංගය වන්නේ,

i. ලිපිනය ii. ජාතිය iii. ජන වර්ගය iv. මුලකුරු සමග නම

18. නූතන ඉන්දියානු කලා ක්ෂේත්‍රයේ පුරෝගාමියා ලෙස හඳුන්වන්නේ,

i. ජවහල්ලාල්නේරු ii. රවීන්ද්‍රනාත් තාගෝර්

iii. මහත්මා ගාන්ධි iv. බර්ට්රන්ඩ් රසල්

19. ගත්කරු ගුණදාස අමරසේකර සූරීන්ගේ කෙටි කතාවක් නොවන්නේ.

i. දෙපා නොලද්දෝ ii. රතු රෝස මල

iii. ජීවන සුවඳ iv. විල් තෙර මරණය

20. දක්ෂ කෙටි කතා කරුවා තම නිර්මාණය රසවත් කරන්නේ,

i. භාෂාව මගිනි. ii. සිද්ධි මගිනි.

iii. අවස්ථා මගිනි. iv. චරිත මගිනි.

## ii කොටස

1 හා 2 යන ප්‍රශ්න ඇතුළුව තවත් ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.

1. පන්ති කාමරය තුළ ඔබ විසින් සිදු කරන ලද කණ්ඩායම් ක්‍රියාකාරකම් ඇසුරින් පහත දැක්වෙන ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

i. සාම්ප්‍රදායික යෙදුම් යනු කුමක් දැයි කෙටියෙන් හඳුන්වන්න.
ii. සාම්ප්‍රදායික යෙදුම් භාවිතයේ ඇති ප්‍රයෝජන දෙකක් ලියන්න.
iii. මෙම ක්‍රියාකාරකම් කිරීමේදී ගුරුතුමාගෙන් හෝ ගුරුතුමියගෙන් ඔබට ලැබුණු උපදෙස් දෙකක් ලියන්න.
iv. සාම්ප්‍රදායික යෙදුම් භාවිතයට යොදා ගත හැකි අවස්ථා දෙකක් ලියන්න.
v. ඔබ ඉගෙන ගත් සාම්ප්‍රදායික යෙදුම් දෙකක් ලියන්න.

(ලකුණු 10)

* පහත සඳහන් මාතෘකා අතුරෙන් එකක් තෝරා ගෙන වචන 150 කට නොවැඩි රචනාවක් ලියන්න.

i. ආවා ආවා අවුරුදු ආවා
ii. සුන්දර රාත්‍රිය
iii. මගේ මව් බිම ශ්‍රී ලංකා
iv. උත්සාහයෙන් දුක ජය ගනිමු.
v. දේශීත පොහොසත් පවුලක දරුවෙක් උසස් පාසලක අධ්‍යාපනය ලබන ඔහු ඉගෙනීමට ඉතා දක්‍ෂය. පාසලේ පවත් වනු ලැබූ නව නිපැයුම් ප්‍රදර්ශනයට ඔහුද සහභාගි විය. මෙම කරුණු ගැන අවධානය යොමු කරමින් කතාවක් ගොඩ නගන්න.

(ලකුණු 20)

03. ඔබ පරිසර නියමු හට කණ්ඩායමේ සාමාජිකයකු යැයි සිතා පොලිතීන් භාවිතයෙන් වන හානි සහ විකල්ප ඇසුරුම් මාධ්‍ය පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීමට සුදුසු දැන්වීම් පත්‍රිකාවක් සකස් කරන්න.

(ලකුණු 10)

04. පහත දැක්වෙන එක් එක් කොටස් කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

i. “මේ ඇත්තටම ඔහේ බත් කෑවේ මොනවා එක්ක ද?” මේ ප්‍රකාශය කවුරුන් විසින් කාගෙන් අසන ලද්දක්ද?

ii. යුද්ධයේ වේදනාව ඔහුගේ හද පත්ලටම කිඳා බැස්සේ ය.

මෙම කොටස ඇතුළත් පාඩමේ නම ලියන්න.

එම පාඩම උපුටාගත් පරිවර්ථන කෘතිය නම් කරන්න.

iii. අහසේ තරු වැල් පිරිලා
පොළොවේ සුදු මල් පිපිලා
................................................
................................................

i. මෙම පද්‍යයේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

ii. මෙම පද්‍ය ඇතුළත් පද්‍ය පංතිය රචනා කරන ලද්දේ කවුරුන් විසින් ද?

iv. (අ) පතසන්අවර ගිරි නැටියෙන් වැටෙන කල
විලිකුන් <u>සුරත්පල</u> වැනි මේ රිවි මඬල
මෙම පද්‍ය කොටස උපුටා ගන්නා ලද සංදේශ කාව්‍ය නම් කරන්න.

(ආ) ඉරි ඇඳි කොටසේ අර්ථය ලියන්න.

v. "හෙට උදේ දහයයි තිහට තමයි අලුත අවුරුදු උදාව සිද්ධ වෙන්නේ"

i. මෙම ප්‍රකාශය කරන ලද්දේකවුරුන් විසින්ද?

ii. මෙම කොටස උපුටා ගන්නා ලද පාඩමේ නම ලියන්න.

05. මුලින් දී අක්ෂරය ඇතුළත් වන සේ වචන 2 බැගින් ලියන්න.

| අක්ෂරය | | |
|---|---|---|
| 1. හ | i. ………………………… | ii. ……………………………… |
| 2. ධ | i. ………………………… | ii. ……………………………… |
| 3. ථ | i. ………………………… | ii. ……………………………… |
| 4. ය | i. ………………………… | ii. ……………………………… |
| 5. ණ | i. ………………………… | ii. ……………………………… |
| 6. ළ | i. ………………………… | ii. ……………………………… |
| 7. ස | i. ………………………… | ii. ……………………………… |
| 8. ෂ | i. ………………………… | ii. ……………………………… |
| 9. ශ | i. ………………………… | ii. ……………………………… |
| 10. බ | i. ………………………… | ii. ……………………………… |

06. දී ඇති පද්‍ය පාඨ අදාළ පරිදි වගු ගත කරන්න.

i. වනාන්තරේ වන සපු මල් පිපීයන්

ii. "ප්‍රේමවන්ත දරුවෙනි මා හිදිනු කන් යොමා"

iii. ගනු අවසර එනිරඳු සිරි පතුල් වැඳ

iv. කැලේ තිබෙන කොයි දේවත් රස වේවා

v. "නොකරන් මා පුතුනේ මේ සටනා"

| විධි ක්‍රියා | ආශීර්වාද ක්‍රියා |
|---|---|
| | |

(ලකුණු 10)